# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,144 - 2019 ඔක්තෝබර් මස 04 වැනි සිකුරාදා - 2019.10.04**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 1714 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | 1715 |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 1729 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 ඔක්තෝබර් මස 25 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 ඔක්තෝබර් මස 11 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


1713 - B 81566 — 5,403 (2019/10)
F 1 -

# පළාත් සභා නිවේදන

## වයඹ පළාත් සභාව

### 1946 අංක 57 දරන පොදු සුසාන සහ පෞද්ගලික සුසාන පිළිබඳ ආඥාපනතේ

11 පරිච්ඡේදයේ 5 (1) වගන්ති යටතේ කරනු ලබන දැන්වීම

1989 අංක 12 දරන පළාත් සභා (අනුශංගික විධිවිධාන) පනතේ දෙවැනි වගන්තිය සමග කියවිය යුතු 1946 අංක 57 දරන පොදු සුසාන සහ පෞද්ගලික සුසාන පිළිබඳ ආඥාපනතේ 11 පරිච්ඡේදයේ 5 (1) වගන්තිය අනුව වයඹ පළාත් සභාවේ ආණ්ඩුකාරවරයා වන සුදසිංහ මුදියන්සේලාගේ පේශල ජයරත්න බණ්ඩාර වන මා විසින් වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ නාරම්මල ප්‍රදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි පහත උපලේඛනයෙන් විස්තර කරනු ලබන සුසානය මළමිණී වැළලීම හෝ ආදාහනය කිරීම පිණිස පොදු සුසානයක් ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

සුදසිංහ මුදියන්සේලාගේ පේශල ජයරත්න බණ්ඩාර
වයඹ පළාත් ආණ්ඩුකාරවර.

2019 අගෝස්තු මස 20 වැනි දින
ආණ්ඩුකාරවර කාර්යාලය,
මාළිගාව,
කුරුණෑගල.

*උපලේඛනය*

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ දඹදෙණිය හත්පත්තුවේ උඩුකහ උතුරු කෝරලේ නාරම්මල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කිවුල්ගල්ල ග්‍රාම නිළධාරි කොට්ඨාසයේ මිණිකුකුළ *හෙවත්* මැටියන්ගල *හෙවත්* මැටියගනේ පල්ලියට අයත් ඉඩම නමැති ඉඩමෙන් 2017 ජූලි මස 18 දින තෙක් කේ. ඒ. අමරතුංග බලයලත් මානකවරයා විසින් මැන සාදන ලද අංක 12220 දරන සැලැස්මට අනුව උතුරට මෙම ඉඩමේ ඉතිරි කොටස ද, නැගෙනහිරට මෙම ඉඩමේ ඉතිරි කොටස ද, දකුණට ගිරිඋල්ල - කුරුණෑගල මහා මාර්ගයද බස්නාහිරට මෙම ඉඩමේ ඉතිරි කොටස ද මායිම් වූ පර්චස් පහලොවක් (පර්.15) විශාල ඉඩම.

10-53/1

---

## වයඹ පළාත් සභාව

### 1946 අංක 57 දරන පොදු සුසාන සහ පෞද්ගලික සුසාන පිළිබඳ ආඥාපනතේ

11 පරිච්ඡේදයේ 5 (1) වගන්ති යටතේ කරනු ලබන දැන්වීම

1989 අංක 12 දරන පළාත් සභා (අනුශංගික විධිවිධාන) පනතේ දෙවැනි වගන්තිය සමග කියවිය යුතු 1946 අංක 57 දරන පොදු සුසාන සහ පෞද්ගලික සුසාන පිළිබඳ ආඥාපනතේ 11 පරිච්ඡේදයේ 5 (1) වගන්තිය අනුව වයඹ පළාත් සභාවේ ආණ්ඩුකාරවර වන සුදසිංහ මුදියන්සේලාගේ පේශල ජයරත්න බණ්ඩාර වන මා විසින් වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ නාරම්මල ප්‍රදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි පහත උපලේඛනයෙන් විස්තර කරනු ලබන සුසානය මළමිණී වැළලීම් හෝ ආදාහනය කිරීම පිණිස පොදු සුසානයක් ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

සුදසිංහ මුදියන්සේලාගේ පේශල ජයරත්න බණ්ඩාර,
වයඹ පළාත් ආණ්ඩුකාරවර.

2019 අගෝස්තු මස 20 වැනි දින,
ආණ්ඩුකාරවර කාර්යාලය,
මාළිගාව,
කුරුණෑගල.

*උපලේඛනය*

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ දඹදෙණිය හත්පත්තුවේ උඩුකහ උතුරු කෝරලේ නාරම්මල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පහමුණේ ග්‍රාම නිළධාරි කොට්ඨාසයේ පහමුනේ පිහිටි ''ඇත්ගාල වත්ත'' නමැති ඉඩමෙන් වර්ෂ 2016 ක් වූ පෙබරවාරි 28 වන දින ආර්. එම්. පුෂ්පදේව මානකවරයා විසින් මැන සාදන ලද අංක 15447 දරන සැලැස්මට අනුව කැබලි අංක ''01'' දරන උතුරට, නැගෙනහිරට සහ බස්නාහිරටත්, ප්‍රසන්න ඔබේසේකරට අයිති ඇත්ගාල වත්තේ ඉතිරි කොටස් ද, දකුණට : එම්. අයි. එම්. අම්ජාඩ්ට හිමිකම් කියන ඉඩමට මායිම් වූ රූඩ් 02 පර්චස් 2.5 ක් විශාල ඉඩම.

10-53/2

# අතුරු ව්‍යවස්ථා

## වයඹ පළාත් සභාව

### 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 123 වගන්තිය යටතේ පල කරනු ලබන නිවේදනය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වන වගන්ති සමග කියවිය යුතු එකී පනතේ 126 (ix) වන වගන්තියෙන් බිංගිරිය ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී ප්‍රාදේශීය සභාව විසින් සාදනු ලැබූ මෙහි පහත දැක්වෙන කුකුළු කර්මාන්තය හේතුවෙන් මහජන පීඩා මැඩපැවැත්වීම හා මහජන සෞඛ්‍ය ආරක්ෂා කිරීම පිළිබඳ වූ අතුරු ව්‍යවස්ථාව 2019.03.12 දින පැවති මහා සභා රැස්වීමේ අංක 05-II (ආ) දරන යෝජනා සම්මුතිය ලබා ඇත. ඒ අනුව 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 123 වන වගන්තිය ප්‍රකාර එකී අතුරු ව්‍යවස්ථාව, වයඹ පළාත් ආණ්ඩුකාරවර පේශල ජයරත්න බණ්ඩාර වන මා විසින් අනුමත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

පේශල ජයරත්න බණ්ඩාර,
වයඹ පළාත් ආණ්ඩුකාරවර,
වයඹ පළාත් ආණ්ඩුකාර කාර්යාලය,
මාළිගාව - කුරුණෑගල.

2019 අගෝස්තු මස 20 වැනි දින,
කුරුණෑගල ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

### කුකුල් කර්මාන්තය හේතුවෙන් සිදුවන මහජන පීඩා මැඩපැවැත්වීම හා මහජන සෞඛ්‍ය ආරක්ෂා කිරීම පිළිබඳව වූ අතුරු ව්‍යවස්ථාව

1. බිංගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කුකුල් මස් හා බිත්තර ලබා ගැනීම පිණිස, කුකුල් පැටවුන් අභිජනනය පිණිස, කුකුලන් සඳහා ආහාර සකස් කිරීම පිණිස, කුකුල් මස් සකස් කිරීම පිණිස ස්ථාන පවත්වාගෙන යාම, අපද්‍රව්‍ය බැහැර කිරීම පිණිස හා පොදුමාර්ග වල කුකුලන් ප්‍රවාහනය කිරීම හේතුවෙන් සිදුවන මහජන පීඩා මැඩපැවැත්වීම හා මහජන සෞඛ්‍ය ආරක්ෂා කිරීම උදෙසා, විධිවිධාන සැලසීම පිණිස මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලබයි.

2. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(1) සමග කියවිය යුතු 126 (ix) වගන්තිය යටතේ මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලැබේ.

3. මෙම අතුරු ව්‍යවස්ථාව බිංගිරිය ප්‍රාදේශීය සභාවේ කුකුල් කර්මාන්තය හේතුවෙන් සිදුවන මහජන පීඩා මැඩපැවැත්වීම හා මහජන සෞඛ්‍ය ආරක්ෂා කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

4. බිංගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කුකුල් මස් හා බිත්තර ලබා ගැනීම පිණිස, කුකුල් පැටවුන් අභිජනනය පිණිස, කුකුලන් සඳහා ආහාර සකස් කිරීම පිණිස, කුකුල් මස් සකස් කිරීම පිණිස ස්ථාන පවත්වාගෙන යන සෑම තැනැත්තෙක්ම ඒ සඳහා මෙම අතුරු ව්‍යවස්ථාවේ 1 වන උපලේඛනය යටතේ වූ බලපත්‍රයක් සභාවේ සභාපතිවරයා වෙතින් ලබා ගත යුතුය.

5. ඉහත 4 වන වගන්තිය යටතේ බලපත්‍රයක් සඳහා ඉල්ලුම්කරනු ලබන සෑම තැනැත්තෙක්ම මෙම අතුරු ව්‍යවස්ථාවේ II වන උපලේඛනයට සාරානුකූලව සභාව විසින් පිළියෙල කළ ආකෘති පත්‍රයක් මගින් ඉල්ලුම් කල යුතුය.

6. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ වූ බලපත්‍රයක් හා බලපත්‍රයක් සඳහා වන ඉල්ලුම් පත්‍රයක් වෙනුවෙන් අයකල යුතු ගාස්තුව සභාව විසින් කලින් කල යෝජනා සම්මුතියක් මගින් තීරණය කර *ගැසට්* නිවේදනයක් මගින් ප්‍රකාශයට පත් කරනු ලබන ගාස්තුවක් විය යුතුය.

7. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ වූ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සභාපතිවරයාට උපදෙස් හා නිර්දේශ ලබා දීම පිණිස පහත නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් විය යුතුය.

   *(අ)* සභාවේ ලේකම් - සභාපති
   *(ආ)* සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී හෝ ඔහුගේ නියෝජිතයෙක් - කමිටු සාමාජික
   *(ඇ)* පශු වෛද්‍ය නිලධාරී හෝ ඔහුගේ නියෝජිතයෙක් - කමිටු සාමාජික
   *(ඈ)* සභාවේ තාක්ෂණ නිලධාරී - කමිටු සාමාජික

(ඉ) සභාවේ පරිසර නිලධාරි - කමිටු සාමාජික
(ඊ) අදාල ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්ගේ නියෝජිතවරයෙක් - කමිටු සාමාජික

8. ඉහත 4 වන වගන්තිය යටතේ සඳහන් බලපත්‍රය සඳහා ඉල්ලුම්කරනු ලබන සෑම තැනැත්තෙක්ම ඒ සඳහා පහත කොන්දේසි සම්පූර්ණ කර තිබිය යුතුය :-

(අ) බලපත්‍රය සඳහා ඉල්ලුම් කරනු ලබන පරිශ්‍රයට අදාල සෑම ඉදිකිරීමක්ම සභාපතිවරයා විසින් අනුමත කරන ලද නියමිත සැලැස්මකට අනුකූලව කරන ලද ඉදිකිරීමක් විය යුතුය.

(ආ) කුකුලන් ඇතිකරන නිවාසයක සිටිය හැකි උපරිම සතුන් සංඛ්‍යාව සභාපතිවරයා විසින් තීරණය කිරීමේ දී මෙම අතුරු ව්‍යවස්ථාවේ III වන උපලේඛනයේ විස්තර කරනු ලබන එක් එක් සත්ව කාණ්ඩය යටතේ එක් සතෙකු සඳහා නියම විය යුතු අවම වර්ග ප්‍රමාණයන් හා කමිටුවේ නිර්දේශයට අනුව සභාපතිවරයා විසින් නියම කල යුතුය.

(ඇ) සෑම පරිශ්‍රයක්ම ප්‍රමාණවත් උසකින් ආවරණය කර තිබිය යුතු අතර, ඊට අදාලව විය යුතු උස ප්‍රමාණයන් පිළිබඳව අවශ්‍ය නිගමනයන් 7 වන වගන්තිය යටතේ වූ කමිටුවේ නිර්දේශයට අනුව සභාපතිවරයා විසින් නියම කරන ලද උසකින් විය යුතුය.

(ඈ) බලපත්‍රයට අදාල පරිශ්‍රය තුළ වන ව්‍යාපාරයට හෝ කර්මාන්තයට අදාල වන සියළු ඉදිකිරීම් පදිංචි නිවසට මීටර් 15 ක් තරම් අවම දුරකින් විය යුතුය.

(ඉ) බලපත්‍රයට අදාල පරිශ්‍රය තුළ කුකුලන් ඇතිකරන නිවසක සිට එය පිහිටි ඉඩමේ මායිම් සඳහා වන අවම දුර ප්‍රමාණයන් පහත ආකාරයට විය යුතුය.

i. සුළු පරිමාණ ගොවිපලවල් සඳහා කුකුලන් ඇතිකරන නිවාසවල සිට ඉඩමේ මායිමට ඇති අවම දුර මීටර් 15 ක් විය යුතුය.
ii. මධ්‍යම පරිමාණ ගොවිපලවල් සඳහා කුකුලන් ඇති කරන නිවාසවල සිට ඉඩමේ මායිමට ඇති අවම දුර මීටර් 20 ක් විය යුතුය.
iii. මහා පරිමාණ ගොවිපලවල් සඳහා කුකුලන් ඇතිකරන නිවාසවල සිට ඉඩමේ මායිමට ඇති අවම දුර මීටර් 50 ක් විය යුතුය.
iv. පරිශ්‍රය තුළ කුකුලන් ඇතිකරන නිවාස දෙකක් අතර පරතරය අවම වශයෙන් මීටර් 6 ක් විය යුතුය. එසේ වුවද මස් පිණිස ඇති කරන සතුන් සඳහා වන විටදී එය මීටර් 9 ක් ලෙස තිබිය යුතුය.
v. බලපත්‍රයක් සඳහා වන සෑම පරිශ්‍රයක් ම මහා පරිමාන ගොවිපලක් වන විටදී පන්සලක් හෝ වෙනත් ආගමික ස්ථානයක්, පාසලක්, රෝහලක්, හෝ මෙම අතුරු ව්‍යවස්ථාවේ 7 වන වගන්තියේ සඳහන් කමිටුව විසින් තීරණය කරනු ලබන පොදු ස්ථානයක සිට මීටර් 300 ක අවම දුරකින් විය යුතු අතර මධ්‍යම පරිමාණ හා සුළු පරිමාණ ගොවිපලක් වන විටදී එය මීටර් 200 ක් විය යුතුය.

(ඊ) මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලාත්මක වන දිනට මෙම අතුරු ව්‍යවස්ථාවට යටත් වන්නා වූ පවත්නා ව්‍යාපාර සම්බන්ධයෙන් වන විටදී ඉහත (අ) වගන්තියේ i, ii, iii, iv, v වගන්ති යටතේ වන දුර ප්‍රමාණයන් නොමැති පරිශ්‍රයක් සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව කමිටුවේ නිර්දේශයට අනුව සභාපතිවරයා විසින් අවශ්‍ය නියමයන් කළ හැකිය. එම තීරණය සම්බන්ධයෙන් සෑහීමකට පත් නොවන අවස්ථාවකදී පළාත් පාලන කොමසාරිස් වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි අතර, ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය.

(උ) ඉල්ලුම් කරනු ලබන බලපත්‍රයට අදාල සෑම ඉදිකිරීමක්ම ජල මූලාශ්‍රයක්, ළිඳක් හෝ ජල මාර්ගයකට මීටර් 15 ක අවම දුරින් විය යුතුය.

(ඌ) ඉල්ලුම් කරනු ලබන බලපත්‍රයට අදාල පරිශ්‍රය සත්ත්ව ආහාර හා මස් සැකසුම් ස්ථානයක් වන විටදී යන්ත්‍ර සූත්‍රවලින් ජනනය වන ශබ්දය මහජන පීඩාවක් නොවන පරිදි පාලනය සඳහා සුදුසු උපක්‍රම භාවිතා කර තිබිය යුතුය.

(එ) අදාල පරිශ්‍රයේ ජනනය වන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා පූතික වලකට යොමු කල යුතු අතර එය ජල මුද්‍රිත විය යුතුය.

(ඒ) ඉල්ලුම් කරනු ලබන බලපත්‍රයට අදාල පරිශ්‍රයේ වන ඉදිකිරීම් වර්ෂාවෙන් හෝ වෙනත් ආකාරයකින් ජලය කාන්දු වන හෝ ජලය මිශ්‍ර නොවන සේ සකස් වී තිබිය යුතු අතර, පරිශ්‍රය තුළ අපජලය ප්‍රවාහනය සඳහා ප්‍රමාණවත් පරිදි සංවෘත කාණු සකස් කර තිබිය යුතුය.

(ඔ) ඉල්ලුම් කරනු ලබන බලපත්‍රයට අදාල පරිශ්‍රය තුළ කාණු පද්ධතිය වෙනත් පරිශ්‍රයකට හෝ පොදු කාණුවකට හෝ ස්වාභාවික ජල මාර්ගයකට හෝ සම්බන්ධ නොවන සේ අදාල පරිශ්‍රය තුළ පූතික වලක් හෝ උරාගන්නා වලකට සම්බන්ධ කර තිබිය යුතුය.

9. 4 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක්ම මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් වගන්ති කඩ කිරීම මත අවලංගු නොකරන්නේනම් අදාල බලපත්‍රය නිකුත් කරන ලද වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන්නේය.

10. *බලපත්‍රලත් සෑම පරිශ්‍රයක්ම,*

(අ) ජනනය වන අපද්‍රව්‍ය ක්‍රමවත්ව බැහැර කළ යුතු අතර එකී පරිශ්‍රයෙහි දුර්ගන්ධය පාලනය කිරීම සඳහා සුදුසු ක්‍රමවේද අනුගමනය කර තිබිය යුතුය.

(ආ) පවත්නා කාණු දිනපතා නඩත්තු කල යුතු අතර, ජලය නොරැඳෙන හෝ ජලය පහසුවෙන් ගලා යාමට හැකි වන පරිදි සකස් කර තිබිය යුතුය.

(ඇ) කුකුලන් රඳවා ඇති ස්ථාන ඇතුලත යොදන ලද දහයියා ආස්තරය ඉවත් කිරීමේ දී ඒවා පොහොර සඳහා ඉවත් කළ හැකි අතර, කිසි විටකත් ඒවා පරිශ්‍රයේ විවෘත භූමිය තුළ ජලයෙන් තෙමෙන සේ ගොඩගසා නොතැබිය යුතුය. ගොවිපලින් බැහැරට ප්‍රවාහනය කරන තෙක් ඒවා සංවෘත මළු තුළ පමණක් අසුරා ගබඩා කොට තැබිය යුතුය.

(ඈ) කුකුලන් රඳවා ඇති ස්ථාන වලට යොදන ලද දහයියා ආස්තරය පරිශ්‍රයෙන් බැහැර කිරීමකින් තොරව පරිශ්‍රය තුළම භාවිතයට ගන්නේනම්, භාවිතයට යෙදවිය යුතු ආකාරය මෙම අතුරු ව්‍යවස්ථාවේ වූ කමිටුවේ නිර්දේශයට පදනම් කරගනිමින් සභාපතිවරයා විසින් නියම කරන ආකාරයකට විය යුතුය.

(ඉ) සේවය කරන සෑම සේවකයකුම සනීපාරක්ෂක මෙවලම් භාවිතා කළ යුතු අතර, එසේ වන බවට බලපත්‍රලාභියා වග බලා ගත යුතුය.

(ඊ) සේවය කරනු ලබන සේවකයින් සඳහා ප්‍රමාණවත් පරිදි වැසිකිළි හා කැසිකිළි පහසුකම් සපයා තිබිය යුතු අතර, ඒවා සියල්ල සෞඛ්‍ය ආරක්ෂිතව මනා තත්වයකින් පවත්වා ගත යුතුය.

(උ) කිසියම් නිෂ්පාදන කාර්යයක් හේතුවෙන් වායු විමෝචනය වේ නම්, විමෝචනය වන වායු විෂහරණය කරනු ලබන ප්‍රමිතීන්ට අනුකූල විය යුතුය.

(ඌ) සේවය කරනු ලබන සේවකයකු බෝවන හෝ අසාධිත රෝගයකින් පෙළෙන අයෙකු හෝ එසේ ආසාධිත හෝ බෝවන රෝගයකින් පෙළෙන අයෙකුට බීජෞෂණ කාලය තුළ උපස්ථාන කරමින් සිටි අයෙකු නොවිය යුතුය.

(එ) බිත්තර සඳහා කුකුලන් ඇති කරන ස්ථානයක් නම් නිෂ්පාදනය කරනු ලබන කැඩුණු බිත්තර බැහැර කළ යුතු අතර අසුචි හෝ වෙනත් අපද්‍රව්‍ය තැවරෙන පරිදි බිත්තර තබා ගැනීම හෝ ගබඩා කිරීම නොකළ යුතු අතර ඒවා පිරිසිදු කර යෝග්‍ය පරිදි අසුරා තැබිය යුතුය.

(ඒ) සේවකයින් සඳහා ආහාර පිසීම මෙන්ම ආහාර පාරිභෝජනය වෙනුවෙන් සුදුසු ස්ථානයක් මනා නඩත්තුව යටතේ පවත්වා ගත යුතුය.

(ඔ) මස් සකස් කරන පරිශ්‍රයක් වන විට දී මස් සකස් කිරීම සඳහා භාවිතා කරන උපකරණ හා මෙවලම් සෞඛ්‍ය ආරක්ෂිත වන පරිදි පවත්වා ගත යුතු අතර, සකස් කරන ලද මස් ගබඩා කිරීම හා ඇසුරුම් කිරීම සඳහා නියමිත ප්‍රමිතින් යටතේ පහසුකම් සලසා තිබිය යුතුය.

(ඕ) පළුදු වූ බිත්තර සහ මියයන සියළු සතුන් විනාශ කළ යුතු අතර, ඒ සඳහා විශේෂිත වූ ස්ථානයක් අදාල පරිශ්‍රය තුළ පවත්වා ගත යුතුය. ඒ සඳහා විශේෂිත වූ ස්ථානයක් වායු මුද්‍රිත අපහරණ වල වශයෙන් පරිශ්‍රය තුළ පවත්වා ගත යුතු අතර එය පදිංචි නිවාසයක සිට මීටර් 15 ක දුරකින් විය යුතුය. අපහරණ වල ජල මූලාශ්‍රයක සිට මීටර් 15 ක අවම දුරින් විය යුතුය.

(ක) පරිශ්‍රය තුළ රෝග වාහකයින් බෝවීම වැලැක්වීම හා අයාලේ යන විලෝපිකයින් පාලනය කිරීම සඳහා සුදුසු ක්‍රමවේදයන් අනුගමනය කළ යුතුය.

(ග) සත්ව අපද්‍රව්‍ය හෝ සත්ව කොටස් හෝ විනාශ කිරීම උදෙසා විවෘත පරිසරයක පිළිස්සීම නොකල යුතුය.

(ට) වසංගත රෝග තත්ත්වයන් වලදී සත්ව විශේෂඥ වෛද්‍යවරයා, පශු වෛද්‍යවරයා හෝ සභාපතිවරයා ලබාදෙන නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු අතර, කිසිදු විටෙක සත්ත්ව කොටස් හෝ වෙනත් කිසිදු අපද්‍රව්‍යක් පාරකට, ඇළකට, දොළකට, පොදු ස්ථානයකට හෝ පෞද්ගලික ස්ථානයකට බැහැර කිරීම නොකල යුතුය.

(ඩ) පරිශ්‍රය තුළ එක් රැස් වන අපද්‍රව්‍ය හා සත්ත්ව කොටස් වසා තැබිය හැකි භාජන තුළ හෝ ඒ වෙනුවෙන්ම සාදන ලද ආවරණයක් සහිත බහාලුමක හැර විවෘත පරිසරයක තිබෙන්නට හැරීම හෝ එක් රැස් කිරීම හෝ නොකල යුතුය.

11. සභා බල ප්‍රදේශයේ බලපත්‍රයට අදාල පරිශ්‍රයක් මෙම අතුරු ව්‍යවස්ථාවේ කොන්දේසි වලට අනුකූලව පවත්වාගෙන යන්නේ ද යන්න පිළිබඳ පරීක්ෂා කිරීම සඳහා සාමාන්‍ය පරිදි පෙ.ව. 6.00 සිට ප.ව.6.00 දක්වා කාලය තුළ හෝ පරීක්ෂා කිරීමේ අවශ්‍යතාවය මත වෙනත් ඕනෑම කාල සීමාවකදී සභාපතිවරයා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු මෙම අතුරු ව්‍යවස්ථාවේ බලපත්‍රයට අයත් පරිශ්‍රයකට ඇතුල්වීම තොරතුරු ඉල්ලා සිටීම, ලේඛන පරීක්ෂා කිරීම නිත්‍යානුකූල වන්නේය.

12. බලපත්‍රලත් පරිශ්‍රයක් තුළ මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ සඳහන් විධිවිධායන්ට පටහැනිව කටයුතු සිදු වන බවට සභාපතිවරයා විසින් සෑහීමකට පත් වන අවස්ථාවක අතුරු ව්‍යවස්ථාවට අනුකූල වන ලෙසට වූ දැන්වීමක් මගින් අතුරු ව්‍යවස්ථාවට අනුකූලව කටයුතු පවත්වාගෙන යාම සඳහා නිශ්චිත කාලයක් බලපත්‍රලාභියා වෙත ලබා දිය යුතුය.

13. මෙම අතුරු ව්‍යවස්ථාවේ 12 වන වගන්තිය යටතේ කරන ලද දැන්වීමකට අනුව බලපත්‍රලාභියා විසින් ඊට අනුගත වීම උදෙසා අතිරේක කාලයක් ලබා දෙන ලෙස සභාපතිවරයාගෙන් ඉල්ලා සිටින්නේ නම් ඒ සඳහා අතිරේක කාලයක් ලබා දිය හැකි අතර, එය අතුරු ව්‍යවස්ථාව බලාත්මක වන දිනෙන් දින 180 ක කාලයක් නොඉක්මවන කාලයක් විය යුතුය.

14. සභාපතිවරයා විසින් මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ කර ඇති දැන්වීමකට අනුකූලවීමට බලපත්‍රලාභියා අපොහොසත් වන විටදී හා තව දුරටත් අතුරු ව්‍යවස්ථාවේ යම් වගන්තියක් උල්ලංඝනය වෙමින් කටයුතු සිදුවන විටදී සභාපතිවරයා විසින් ඊට අදාළ බලපත්‍රය අවලංගු කිරීම නිත්‍යානුකූල වන්නේය.

15. මෙම අතුරු ව්‍යවස්ථාවේ කවර හෝ වගන්තියක් උල්ලංඝනය කිරීම වරදක් වන අතර, එම වරද සම්බන්ධයෙන් බලය ඇති අධිකරණයක් විසින් වරදකරු කිරීමෙන් පසු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(2) වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් වන්නේය.

16. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයකට යටත් පරිශ්‍රයක සිට බල ප්‍රදේශය තුළ හෝ ඉන් පිටත කවර හෝ පරිශ්‍රයක් සඳහා කුකුලන් ප්‍රවාහනය කරනු ලබන විටකදී එසේ ප්‍රවාහනය කරනු ලබන සෑම තැනැත්තෙක්ම ප.ව. 6.00 සිට පෙ.ව. 6.00 දක්වා කාලය තුළ පමණක් ප්‍රවාහනය කිරීමට කටයුතු කළ යුතුය.

17. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ,

අදාළ ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් යන්නෙන් කර්මාන්තයට අදාල බල ප්‍රදේශයට අයත් වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්වරයා ද,

''සභාපති'' යන්නෙන් බිංගිරිය ප්‍රාදේශීය සභාවේ සභාපති ද,

''සභාව'' යන්නෙන් බිංගිරිය ප්‍රාදේශීය සභාව ද,

''සුදුසු ද්‍රව්‍යයක්'' යන්නෙන් ගඩොලින් හෝ වෙනත් බදාමයකින් හෝ ඇස්බැස්ටස් හෝ වෙනත් යම් තහඩුවකින් හෝ වෙනත් විශේෂයෙන් සකස් කරන ලද ද්‍රව්‍යයක් ද,

''කුකුලා'' යන්නෙන් බිත්තර පිණිස හෝ මස් පිණිස ඇති කරන කුකුලන් ද, කළුකුං ද,

''බලයලත් නිලධාරියා'' යන්නෙන් සභාපතිවරයා විසින් නිශ්චිතව ඒ සඳහා බලය දෙන ලද නිලධාරියෙක් ද,

''තැනැත්තා'' යන්නෙන් යම් පුද්ගලයෙකු හෝ සංස්ථාගත කරන ලද හෝ නොකරන ලද පුද්ගල මණ්ඩලයක් ද,

''සුළු පරිමාණ ගොවිපලක්'' යන්නෙන් බලපත්‍රය සඳහා ඉල්ලුම් කරන අවස්ථාවේ ගොවිපලේ සිටින කුකුළන් සංඛ්‍යාව 50-1000 අතර ගොවිපලක් ද,

''මධ්‍ය පරිමාණ ගොවිපලක්'' යන්නෙන් බලපත්‍රය සඳහා ඉල්ලුම් කරන අවස්ථාවේ ගොවිපලේ සිටින කුකුළන් සංඛ්‍යාව 1001-2499 අතර ගොවිපලක්ද,

''මහා පරිමාණ ගොවිපලක්'' යන්නෙන් බලපත්‍රය සඳහා ඉල්ලුම් කරන අවස්ථාවේදී ගොවිපලේ සිටින කුකුලන් සංඛ්‍යාව - 2500 ට හෝ ඊට වැඩි වන ගොවිපලක් ද අදහස් වේ.

''අදාල ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්වරයාගේ නියෝජිතයෙකු'' යන්නෙන් කර්මාන්තයට අදාල බලප්‍රදේශයට අයත්වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්වරයාගේ බලයලත් නියෝජිතයෙකු අදහස් වේ.

''පොදු ස්ථානයක්'' යන්නෙන් කිසියම් මාර්ගයක්, මං මාවතක්, වීථියක්, පටුමඟක්, දෙවැටක්, පදික වේදිකාවක්, පොදු ඉඩමක්, කිසියම් රක්ෂිතයක්, ක්‍රීඩා පිට්ටනියක්, පොදු ගොඩනැගිල්ලක්, පොදු සුසාන භූමියක්, බස් නැවතුම් පළක්, දුම්රිය ස්ථානයක්, ගංගාවක්, ඇළක්, දොළක්, වැවක්, පොකුණක්, කලපුවක්, දිය කඩිත්තක්, දිය පහරක්, වැසි ජල කාණුවක්, මුහුදු වෙරළක්, සභාව සතු ඉඩමක්, මහජනයාගේ පරිහරණය සඳහා වෙන්කර ඇති රජය සතු ඉඩමක් හෝ මහජනයාගේ පොදු පරිහරණයට ලක්වන වෙනත් ඕනෑම ස්ථානයක් අදාල වේ.

18. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර, යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුත්තේ ය.

**උපලේඛන අංක III**

කුකුලන් ඇති කරන නිවාසවලට පක්ෂීන් දැමීමේදී යොදා ගත යුතු අවම ඉඩ ප්‍රමාණය පහත සඳහන් වේ :-

| | |
|---|---|
| පැටවුන් | එක පැටවෙකු සඳහා වර්ග අඩි 0.5 (වර්ග මීටර 0.05) සිට වර්ග අඩි 01 (වර්ග මීටර 0.09) කි. |
| වැඩෙන සතුන් | එක සතෙකු සඳහා වර්ග අඩි 01 (වර්ග මීටර 0.09) සිට වර්ග අඩි 1.5 (වර්ග මීටර 0.14) කි. |
| බිත්තර දමන සතුන් | එක සතෙකු සඳහා වර්ග අඩි 02(වර්ග මීටර 0.19) සිට වර්ග අඩි 3.0 (වර්ග මීටර 0.28) කි. |
| අභිජනනය සතුන් (බිත්තර දමන) | එක සතෙකු සඳහා වර්ග අඩි 02 (වර්ග මීටර් 0.19) සිට වර්ග අඩි 3.0 (වර්ග මීටර 0.28) කි. |
| අභිජනන සතුන් (බ්‍රොයිලර්) | එක සතෙකු සඳහා වර්ග අඩි 03 (වර්ග මීටර 0.28) සිට වර්ග අඩි 3.5 (වර්ග මීටර 0.33) කි. |
| බ්‍රොයිලර් | එක සතෙකු සඳහා වර්ග අඩි 0.8 (වර්ග මීටර් 0.07) සිට වර්ග අඩි 01 (වර්ග මීටර 0.11) කි. |

**උපලේඛන අංක 1**

**බිංගිරිය ප්‍රාදේශීය සභාව**

කුකුල් කර්මාන්තය හේතුවෙන් සිදු වන මහජන පීඩා මැඩපැවැත්වීම හා මහජන සෞඛ්‍ය ආරක්ෂා කිරීම පිළිබඳ වූ අතුරු ව්‍යවස්ථාව යටතේ වූ බලපත්‍රයයි

බලපත්‍ර අංකය :..............................................

01. බලපත්‍රලාභියාගේ නම :..............................................

02. ලිපිනය :..............................................

03. ව්‍යාපාරය පිහිටි ස්ථානයේ ලිපිනය :..............................................

04. හැඳුනුම්පත් අංකය :..............................................

05. ඉල්ලුම් පත්‍ර අංකය :..............................................

06. නිකුත් කළ දිනය :..............................................

07. වලංගු කාලය :..............................................

..............................................
සභාපති
ප්‍රාදේශීය සභාව,
බිංගිරිය.

දිනය :..............................

## උපලේඛන අංක II

බිංගිරිය ප්‍රාදේශීය සභාව

කුකුල් කර්මාන්තය හේතුවෙන් සිදුවන මහජන පීඩා මැඩපැවැත්වීම හා මහජන සෞඛ්‍ය ආරක්ෂා කිරීම පිළිබඳ වූ අතුරු ව්‍යවස්ථාව යටතේ වූ ව්‍යාපාරයක් පවත්වාගෙන යාමේ බලපත්‍රයක් සඳහා වන ඉල්ලුම්පත්‍රය

1. ව්‍යාපාරය :......................................................................................................................................................

2. ව්‍යාපාරය පිහිටි ස්ථානයේ ලිපිනය :..........................................................................................................

3. ඉල්ලුම් කරනු ලබන්නාගේ නම :................................................................................................................

4. ලිපිනය :......................................................................................................................................................

5. ග්‍රාම නිලධාරි වසම :..................................................................................................................................

6. දුරකථන අංකය :..........................................................................................................................................

7. ඉල්ලුම්කරු පරිශ්‍රයේ/ඉඩමේ අයිතිකරු නොවන අවස්ථාවක දී,

   අයිතිකරුගේ නම :..............................................................................................
   ලිපිනය :..............................................................................................................
   දුරකථන අංකය :..................................................................................................

8. ව්‍යාපාරයේ ඇති කරනු ලබන සතුන් සංඛ්‍යාව :.............................................................................................

9. එම සතුන් මස් සඳහා/බිත්තර සඳහා/සතුන් බෝ කිරීම සඳහා/සත්ත්ව කෑම සැකසීම සඳහාද යන බව :..................................

10. පරිශ්‍රය තුළ සිටිය හැකි උපරිම සතුන් සංඛ්‍යාව :.........................................................................................

11. පරිශ්‍රයට අදාල සම්පූර්ණ භූමි ප්‍රමාණය, (සනාථ කිරීම සඳහා වන මිනින්දෝරු සැලැස්මේ පිටපතක්), ඉදිකිරීමට අදාල අනුමත සැලැස්මේ පිටපතක්, පෙර වර්ෂයේ බලපත්‍රයේ පිටපතක් (අදාල වන විට දී), බදු ඔප්පුවක් හෝ පිළිගත හැකි සහතික පත්‍රයක් ඇමිණිය යුතුය.

12. පරිශ්‍රයට පැමිණෙන දළ මාර්ගය :..............................................................................................................
    ..........................................................................................................................................................
    ..........................................................................................................................................................
    ..........................................................................................................................................................

මා විසින් සපයා ඇති ඉහත සඳහන් විස්තර සත්‍ය ඒවා බවත්, මාගේ ව්‍යාපාර සඳහා ගාස්තු අයකර බලපත්‍රයක් ලබා දෙන ලෙසත්, ප්‍රාදේශීය සභාව විසින් පනවා ඇති සියළු කොන්දේසි හා නියෝගවලට මා යටත් වන බවත්, මෙයින් අත්සන් කර පොරොන්දු වෙමි.

......................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :.....................................

**කමිටු නිර්දේශය**

ගරු සභාපතිතුමා,
බිංගිරිය ප්‍රාදේශීය සභාව.

පහත කොන්දේසිවලට යටත්ව නිර්දේශ කරමි/නොකරමි.

කොන්දේසි/නිර්දේශ නොකිරීමට හේතු,

.............................................................................................................................................................................................................................
.............................................................................................................................................................................................................................
.............................................................................................................................................................................................................................
.............................................................................................................................................................................................................................

කමිටු සභාපති ..............................................
කමිටු සාමාජිකයින් ..............................................
..............................................
..............................................
..............................................

ඉහත දක්වා ඇති තොරතුරු අනුව එම ස්ථානයේ ......................................................... ව්‍යාපාරයක් පවතින බවත් ............................ වර්ෂයට අදාලව මෙම අතුරු ව්‍යවස්ථාවට අනුකූල බලපත්‍රයක් යටතේ ව්‍යාපාරයක් එහි පවත්නා බවත්, ඒ සඳහා වන අවසරපත්‍ර ගාස්තුව රුපියල් .................................... බවත් සහතික කරමි.

දිනය :.................................... ....................................................................
ආදායම් පරීක්ෂක/ ආදායම් පරිපාලක.

---

ගරු සභාපතිතුමා,
බිංගිරිය ප්‍රාදේශීය සභාව.

නිර්දේශ කර අනුමැතියට ඉදිරිපත් කරමි.

දිනය :.................................. ............................................................
ලේකම්.

---

ලේකම්තුමා,
බිංගිරිය ප්‍රාදේශීය සභාව.

අනුමත කරමි/නොකරමි.

දිනය :.................................. ............................................................
සභාපති.

10-408

## වයඹ පළාත් සභාව

### 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 123 වගන්තිය යටතේ පල කරනු ලබන නිවේදනය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වන වගන්ති සමග කියවිය යුතු එකී පනතේ 126 (ix) සහ 126 (xi) වන වගන්තියෙන් බිංගිරිය ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී ප්‍රාදේශීය සභාව විසින් සාදනු ලැබූ මෙහි පහත දැක්වෙන ඌරු කර්මාන්තය හේතුවෙන් මහජන පීඩා මැඩපැවැත්වීම හා මහජන සෞඛ්‍ය ආරක්ෂා කිරීම පිළිබඳ වූ අතුරු ව්‍යවස්ථාව 2019.03.12 දින පැවති මහා සභා රැස්වීමේ අංක 05.II (ඇ) දරන යෝජනා සම්මුතිය ලබා ඇත. ඒ අනුව 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 123 වන වගන්තිය ප්‍රකාර එකී අතුරු ව්‍යවස්ථාව, වයඹ පළාත් ආණ්ඩුකාරවර පේශල ජයරත්න බණ්ඩාර වන මා විසින් අනුමත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

පේශල ජයරත්න බණ්ඩාර,
වයඹ පළාත් ආණ්ඩුකාරවර,
වයඹ පළාත් ආණ්ඩුකාර කාර්යාලය,
මාළිගාව - කුරුණෑගල.

2019 අගෝස්තු මස 20 වැනි දින,
කුරුණෑගල ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

**ඌරු කර්මාන්තය හේතුවෙන් සිදුවන මහජන පීඩා මැඩපැවැත්වීම හා මහජන සෞඛ්‍ය ආරක්ෂා කිරීම පිළිබඳ වූ අතුරු ව්‍යවස්ථාව**

1. බිංගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මස් පිණිස ඌරන් ඇති කිරීම හා ඌරු පැටවුන් අභිජනනය පිණිස, ඌරන් සඳහා ආහාර සකස් කිරීම පිණිස, ඌරු මස් සකස් කිරීම පිණිස, ස්ථාන පවත්වාගෙන යාම, අපද්‍රව්‍ය බැහැර කිරීම පිණිස හා පොදු මාර්ගවල ඌරන් ප්‍රවාහනය හේතුවෙන් සිදුවන මහජන පීඩාවන් මැඩපැවැත්වීම හා මහජන සෞඛ්‍ය ආරක්ෂා කිරීම උදෙසා විධිවිධාන සැකසීම පිණිස මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලබයි.

2. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(1) සමග කියවිය යුතු 126 (ix) සහ 126 (xi) වගන්තිය යටතේ මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලැබේ.

3. මෙම අතුරු ව්‍යවස්ථාව බිංගිරිය ප්‍රාදේශීය සභාවේ ඌරු කර්මාන්තය හේතුවෙන් සිදුවන මහජන පීඩා මැඩපැවැත්වීම හා මහජන සෞඛ්‍ය ආරක්ෂා කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

4. බිංගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මස් පිණිස ඌරන් ඇති කිරීම, ඌරු පැටවු අභිජනනය පිණිස, ඌරන් සඳහා ආහාර සකස් කිරීම පිණිස, ඌරු මස් සකස් කිරීම පිණිස ස්ථාන පවත්වාගෙන යන සෑම තැනැත්තෙක්ම ඒ සඳහා අතුරු ව්‍යවස්ථාවේ I වන උපලේඛනය යටතේ වූ බලපත්‍රයක් සභාවේ සභාපතිවරයා වෙතින් ලබා ගත යුතුය.

5. ඉහත 4 වන වගන්තිය යටතේ බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කරනු ලබන සෑම තැනැත්තෙක්ම මෙම අතුරු ව්‍යවස්ථාවේ II වන උපලේඛනයට සාරානුකූලව සභාව විසින් පිළියෙල කළ ආකෘති පත්‍රයක් මගින් ඉල්ලුම් කළ යුතුය.

6. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ වූ බලපත්‍රයක් හා බලපත්‍රයක් සඳහා වන ඉල්ලුම් පත්‍රයක් වෙනුවෙන් අයකල යුතු ගාස්තු සභාව විසින් කලින් කල යෝජනා සම්මුතියක් මගින් තීරණය කර *ගැසට්* නිවේදනයක් මගින් ප්‍රකාශයට පත් කරනු ලබන ගාස්තුවක් විය යුතුය.

7. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ වූ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සභාපතිවරයාට උපදෙස් හා නිර්දේශ ලබා දීම පිණිස පහත නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් විය යුතුය.

   *(අ)* සභාවේ ලේකම් - සභාපති,
   *(ආ)* සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි හෝ ඔහුගේ නියෝජිතයෙක් - කමිටු සාමාජික,
   *(ඇ)* පශු වෛද්‍ය නිලධාරි හෝ ඔහුගේ නියෝජිතයෙක් - කමිටු සාමාජික,
   *(ඈ)* සභාවේ තාක්ෂණ නිලධාරි - කමිටු සාමාජික,
   *(ඉ)* සභාවේ පරිසර නිලධාරි - කමිටු සාමාජික.
   (ඊ) අදාල ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්ගේ නියෝජිතවරයෙක් - කමිටු සාමාජික.

8. ඉහත 4 වන වගන්තිය යටතේ සඳහන් බලපත්‍රය සඳහා ඉල්ලුම් කරනු ලබන සෑම තැනැත්තෙක්ම ඒ සඳහා පහත කොන්දේසි සම්පූර්ණ කර තිබිය යුතුය.

*(අ)* බලපත්‍රය සඳහා ඉල්ලුම් කරනු ලබන පරිශ්‍රයට අදාළ සෑම ඉදිකිරීමක්ම සභාපතිවරයා විසින් අනුමත කරන ලද නියමිත සැලැස්මකට අනුකූලව කරන ලද ඉදිකිරීමක් විය යුතුය.

*(ආ)* යම් ගොඩනැගිල්ලක සිටිය හැකි උපරිම ඌරන් සංඛ්‍යාව සතුන්ගේ වයස් සීමාව සැලකිල්ලට ගෙන තීරණය කළ යුතු අතර වැඩුණු සතුන් සම්බන්ධයෙන් වන විට එක් ඌරකු සඳහා වර්ග අඩි 10 ක් අවම ඉඩ ප්‍රමාණය වශයෙන් සැලකිය යුතුය.

*(ඇ)* සෑම පරිශ්‍රයක්ම ප්‍රමාණවත් උසකින් ආවරණය කර තිබිය යුතු අතර ආවරණය කළ යුතු උස ප්‍රමාණය ඉදිකිරීමේ වර්ග ප්‍රමාණය ද සැලකිල්ලට ගෙන 7 වන වගන්තිය යටතේ වූ කමිටුවේ නිර්දේශ මත සභාපතිවරයා විසින් නියම කළ යුතුය.

*(ඈ)* බලපත්‍රයකට අදාළ පරිශ්‍රයක් තුළ වන ව්‍යාපාරයට අදාළ කර්මාන්තය සෑම ඉඩමකම පදිංචි නිවසකට මීටර් 15 වන අවම දුරකින් විය යුතු අතර පොදු පරිශ්‍රයක් හෝ අසල්වැසි ඉඩමකට යාබද වීමේදී එකී මායිම් තාප්පයකින් ආවරණය කර තිබිය යුතුය.

*(ඉ)* බලපත්‍රයට අදාළ පරිශ්‍රය තුළ ඌරන් ඇති කරන නිවාසයක සිට එයට පිහිටි ඉඩමේ මායිම දක්වා අවම දුර ප්‍රමාණය පහත ආකාරයට විය යුතුය.

(i) ගෘහස්ථ මට්ටමේ ගොවිපලවල් සඳහා ඌරු කොටුවල සිට ඉඩමේ මායිමට දුර අවම මීටර් 10 ක් විය යුතුය.
(ii) සුළු පරිමාණ ගොවිපලවල් සඳහා ඌරු කොටුවල සිට ඉඩමේ මායිමට අවම දුර මීටර් 15 ක් විය යුතුය.
(iii) මධ්‍යම පරිමාණ ගොවිපලවල් සඳහා ඌරු කොටුවල සිට ඉඩමේ මායිමට අවම දුර මීටර් 20 ක් විය යුතුය.
(iv) මහා පරිමාණ ගොවිපලවල් සඳහා ඌරු කොටුවල සිට ඉඩමේ මායිමට අවම දුර මීටර් 50 ක් විය යුතුය.
(v) ඌරු කොටු 2 ක් අතර පරතරය අවම මීටර් 2 ක් ලෙස පවත්වා ගත යුතුය.

*(ඊ)* මෙම අතුරු ව්‍යවස්ථාව බලාත්මකවන දිනට මෙම අතුරු ව්‍යවස්ථාවට යටත්වන්නා වූ පවත්නා ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වන විට දී ඉහත (ඉ) වගන්තියේ I, II, III, IV, V වගන්ති යටතේවන දුර ප්‍රමාණයන් නොමැති පරිශ්‍රයක් සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව කමිටුවේ නිර්දේශයට අනුව සභාපතිවරයා විසින් අවශ්‍ය නියමයන් කළ හැකිය. එම තීරණය සම්බන්ධයෙන් සෑහීමකට පත් නොවන අවස්ථාවකදී පළාත් පාලන කොමසාරිස් වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි අතර, ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

*(උ)* ඉල්ලුම් කරනු ලබන බලපත්‍රයට අදාළ සෑම පරිශ්‍රයක් ම ජල මූලාශ්‍රයක්, ළිඳක් හෝ ජල මාර්ගයට මීටර් 15 ක අවම දුරකින් විය යුතුය.

*(ඌ)* ඉල්ලුම් කරනු ලබන බලපත්‍රයට අදාල පරිශ්‍රය සත්ත්ව ආහාර හා මස් සැකසුම් ස්ථානයක්වන විටදී යන්ත්‍ර සූත්‍රවලින් ජනනය වන ශබ්දය මහජන පීඩාවක් නොවන පරිදි පාලනය සඳහා සුදුසු උපක්‍රම භාවිතා කර තිබිය යුතුය.

*(එ)* අදාළ පරිශ්‍රයේ ජනනයවන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා පූතික වළකට යොමු කළ යුතු අතර එසේ වුවද මධ්‍ය පරිමාණ ගොවිපලක් සම්බන්ධව වන විටදී බැහැර කරන අපද්‍රව්‍ය ජීව වායු ඒකකයට යොමු කර පිරිපහදු කළ යුතු අතර මහා පරිමාණ ගොවිපලක්වන විටදී ජීව වායු ඒකකයක් වෙත යොමු කිරීමේ හෝ අපද්‍රව්‍ය ප්‍රතිකර්ම පද්ධතියක් සඳහා යොමු කර පිරිපහදු කළ යුතුය.

*(ඒ)* ඉල්ලුම් කරනු ලබන බලපත්‍රයට අදාළ පරිශ්‍රයේ වන ඉදිකිරීම් වර්ෂාවෙන් හෝ වෙනත් ආකාරයකින් ජලය කාන්දුවන හෝ ජලය මිශ්‍ර නොවන සේ සකස් වී තිබිය යුතු අතර පරිශ්‍රය තුළ අපජලය ප්‍රවාහනය සඳහා ප්‍රමාණවත් පරිදි සංවෘත කාණු සකස් කළ යුතුය.

*(ඔ)* බලපත්‍රයක් සඳහාවන සෑම පරිශ්‍රයක්ම මහා පරිමාන ගොවිපලක්වන විට දී, පන්සලක් හෝ වෙනත් ආගමික ස්ථානයක්, පාසලක්, රෝහලක් හෝ මෙම අතුරු ව්‍යවස්ථාවේ 7 වන වගන්තියේ සඳහන් කමිටුව විසින් තීරණය කරනු ලබන පොදු ස්ථානයක සිට මීටර් 300ක අවම දුරකින් විය යුතු අතර මධ්‍යම පරිමාන හා සුළු පරිමාන ගොවිපලක්වන විට දී එය මීටර් 200ක් විය යුතුය.

*(ඕ)* ඉල්ලුම් කරනු ලබන බලපත්‍රයට අදාළ පරිශ්‍රය කාණු පද්ධතිය වෙනත් පරිශ්‍රයකට හෝ පොදු කාණුවකට හෝ ස්වභාවික ජල මාර්ගයකට හෝ සම්බන්ධ නොවන සේ අදාළ පරිශ්‍රය තුළ ජලමුද්‍රිත සහිත පූතික වළකට යොමු කළ යුතු අතර තව ද ඌරන් සිටින ටැංකිය කොන්ක්‍රීට් කර ටයිල් කර තිබිය යුතුය.

(ක) බලපත්‍රයට අදාළ සෑම පරිශ්‍රයක් යටතේම ප්‍රමාණවත් ජල මූලාශ්‍රයක් යටතේ ජලය එක්රැස් කිරීමේ හැකියාවත්, බැහැරින් ජලය සම්පාදනය කරන විට දී ප්‍රමාණවත් පරිදි ජලය ගබඩා කිරීමේ පහසුකම් සහිත බවටත් ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් ලබා දෙන සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

9. ඉහත 4 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක්ම මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් වගන්ති කඩ කිරීම මත අවලංගු නොකරන්නේ නම් අදාළ බලපත්‍රය නිකුත් කරන ලද වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන්නේය.

10. බලපත්‍රලත් සෑම පරිශ්‍රයක්ම,

(අ) සතුන් ඇති කිරීමට ප්‍රමාණවත් පහසුකම් සහිත පරිශ්‍රයක් විය යුතුය.

(ආ) ජනනයවන අපද්‍රව්‍ය ක්‍රමවත්ව බැහැර කළ යුතු අතර එකී පරිශ්‍රයේ දුර්ගන්ධය පාලනය කිරීම සඳහා සුදුසු ක්‍රමවේද අනුගමනය කර තිබිය යුතුය.

(ඇ) පවත්නා කාණු දිනපතා නඩත්තු කළ යුතු අතර ජලය නොරැඳෙන සේ හා ජලය පහසුවෙන් ගලා යාමට හැකිවන පරිදි සකස් කර තිබිය යුතුය.

(ඈ) පරිශ්‍රයෙන් ඉවත් කරනු ලබන කවර හෝ අපද්‍රව්‍යයක් පොහොර සඳහා භාවිතා කළ හැකි අතර එය භාවිතය සඳහා ඒ සඳහා නිශ්චිතව පිළියෙල කරන ලද වලකට දමා වළලා තැබිය යුතු අතර කිසිවිටෙකත් එය පරිශ්‍රයේ විවෘත භූමියක් තුළ පවත්වා නොගත යුතුය. මෙම උපවගන්තිය යටතේ බැහැර කරන අපද්‍රව්‍ය කිසිදු ජල මූලාශ්‍රයකට මීටර් 30 ක අවම දුරක් තුළ කිසිදු ආකාරයකින් වළලා තැබීම නොකළ යුතුය.

(ඉ) ඌරු ගොවිපල යටතේ ජනනයවන අපද්‍රව්‍ය කමිටුවේ අධීක්ෂණය මගින් ලබා දෙන උපදෙස් අනුව අපහරණය කිරීම නීත්‍යානුකූල වන්නේය. එසේම ඌරු ගොවිපලක් යටතේ ජනනයවන අපද්‍රව්‍ය වෙනත් ඉඩමකට දමන්නේ නම් එසේ බැහැර කරන ක්‍රියා පටිපාටිය 7 වන වගන්තියේ දැක්වෙන කමිටුවේ නිර්දේශ මත සභාපතිවරයා විසින් බලපත්‍රලාභියා වෙත නියම කළ හැකිය.

(ඊ) සේවය කරන සෑම සේවකයකුම සනීපාරක්ෂක මෙවලම් භාවිතා කළ යුතු අතර එසේ වන බවට බලපත්‍රලාභියා වග බලා ගත යුතුය.

(උ) සේවය කරනු ලබන සේවකයන් සඳහා ප්‍රමාණවත් පරිදි වැසිකිළි සහ කැසිකිළි පහසුකම් සපයා තිබිය යුතු අතර ඒවා සියල්ල සෞඛ්‍ය ආරක්ෂිතව මනා තත්වයකින් පවත්වා ගත යුතුය.

(ඌ) ජීව වායු හේතුවෙන් වායු විමෝචනය වේ නම් විමෝචනය වන වායු විෂහරණය කරනු ලබන ප්‍රමිතීන්ට අනුකූල විය යුතුය.

(එ) සේවය කරනු ලබන සේවකයකු බෝ වන හෝ ආසාධිත රෝගයකින් පෙළෙන අයකු හෝ එසේ ආසාධිත හෝ බෝ වන රෝගයකින් පෙළෙන අයකුට බීජෞෂණ කාලය තුළ උපස්ථාන කරමින් සිටි අයකු නොවිය යුතුය.

(ඒ) ඌරන්ගේ ආහාර සඳහා රැගෙන එන ඉඳුල්මය ආහාර හෝ සත්ව කොටස් ගබඩා කිරීම සඳහා විශේෂිත පහසුකම් සලසා නොමැත්තේ නම් දිනකට වඩා තබා ගැනීම නොකළ යුතු අතර ඒවා ප්‍රවාහනයේ දී සංවෘත භාජනවල බහා ප්‍රවාහනය කිරීම කළ යුතුය.

(ඔ) සේවකයන් සඳහා ආහාර පිසීම හා ආහාර පරිභෝජනය වෙනුවෙන් සුදුසු ස්ථානයක් මනා නඩත්තුව යටතේ පවත්වා ගත යුතුය.

(ඕ) මස් සකස් කරන ලද පරිශ්‍රයක්වන විටදී මස් සකස් කිරීම සඳහා භාවිතා කරන උපකරණ හා මෙවලම් සෞඛ්‍යය ආරක්ෂිතවන පරිදි පවත්වා ගත යුතු අතර සකස් කරන ලද මස් ගබඩා කිරීම හා ඇසුරුම් කිරීම සඳහා නියමිත ප්‍රමිතීන් යටතේ පහසුකම් සලසා තිබිය යුතුය.

(ක) රෝගී තත්වයන් යටතේ මියැදෙන සතුන් විනාශ කළ යුතු අතර ඒ සඳහා විශේෂිත වූ ස්ථානයක් අදළ පරිශ්‍රය තුළ පවත්වාගත යුතු අතර එම ස්ථානය සත්ත්ව නිවාසවල සිට අඩි 100 ක අවම දුරකින් ඉදිකළ යුතු මෙන්ම සම්මත ප්‍රමිතින් අනුව සකස් කර ගත යුතුය.

*(ග)* පරිශ්‍රය තුළ රෝග වාහකයින් බෝවීම වැළැක්වීම හා අයාලේ යන විලෝපිකයන් පාලනය කිරීම සඳහා සුදුසු ක්‍රමවේදයන් අනුගමනය කළ යුතු අතර දුර්ගන්ධය පාලනය කිරීමට සුදුසු ක්‍රමවේදයන් සකස් කළ යුතුය.

*(ඝ)* වසංගත රෝග තත්ත්වයන්වලදී සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයා, පශු වෛද්‍යවරයා හා සභාපතිවරයා ලබාදෙන නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු අතර, මළ සතකු හෝ සත්ත්ව කොටස් බැහැර කිරීමේ දී කිසිදු විටෙක ඉහතින් නිර්දේශ ලබාදෙන තිදෙනාගේ නිර්දේශ මත පාරකට, ඇලකට, දොලකට හෝ මෙහි 7 වන වගන්තියේ සඳහන් කමිටුව විසින් තීරණය කරනු ලබන පොදු ස්ථානයකට හෝ පුද්ගලික ස්ථානයකට බැහැර කිරීම නොකළ යුතුය.

*(ජ)* සත්ත්ව අපද්‍රව්‍ය හෝ සත්ත්ව කොටස් විනාශ කිරීම උදෙසා විවෘත පරිසරයක පිළිස්සීම නොකළ යුතුය.

*(ට)* ඌරන් සඳහා නියම කර ඇති එන්නත් නිසි පරිදි ලබා දී එසේ ලබාදුන් බවටවන සහතිකයක් අවශ්‍ය ඕනෑම විටෙක ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි තබා ගත යුතුය.

*(ඩ)* ස්වාභාවිකව මියයන කවර හෝ සතකුගේ මාංශ මිනිස් පරිභෝජනය සඳහා අලෙවි කිරීමක් කිසිදු ආකාරයකින් නොකළ යුතුය.

*(ණ)* බලපත්‍රලත් කිසිදු පරිශ්‍රයක හෝ ඝාතක ආඥපනත යටතේවන බලපත්‍රයකින් තොරව සත්ව ඝාතනයක් සිදු නොකළ යුතුය.

11. සභා බල ප්‍රදේශයේ බලපත්‍රයට අදළ පරිශ්‍රයක් මෙම අතුරු ව්‍යවස්ථාවේ කොන්දේසිවලට අනුකූලව පවත්වා ගෙන යන්නේ ද යන්න පිළිබඳ පරීක්ෂා කිරීම සඳහා සාමාන්‍ය පරිදි පෙ. ව. 6.00 සිට ප. ව. 6.00 දක්වා කාලය තුළ හෝ පරීක්ෂා කිරීමේ අවශ්‍යතාව මත වෙනත් ඕනෑම කාල සීමාවකදී සභාපතිවරයා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු මෙම අතුරු ව්‍යවස්ථාවේ බලපත්‍රයට අයත් පරිශ්‍රයකට ඇතුල්වීම, තොරතුරු ඉල්ලා සිටීම, ලේඛන පරික්ෂා කිරීම නිත්‍යානුකූල වන්නේය.

12. බලපත්‍රලත් පරිශ්‍රයක් තුළ මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ සඳහන් විධිවිධානයන්ට පටහැනිව කටයුතු සිදුවන බවට සභාපතිවරයා විසින් සෑහීමකට පත්වන අවස්ථාවක අතුරු ව්‍යවස්ථාවට අනුකූලවන ලෙසට වූ දැන්වීමක් මගින් අතුරු ව්‍යවස්ථාවට අනුකූලව කටයුතු පවත්වාගෙන යාම සඳහා නිශ්චිත කාලයක් බලපත්‍රලාභියා වෙත ලබාදිය යුතුය.

13. මෙම අතුරු ව්‍යවස්ථාවේ 12 වන වගන්තිය යටතේ කරන ලද දැන්වීමකට අනුව බලපත්‍රලාභියා විසින් ඊට අනුගත වීම උදෙසා අතිරේක කාලයක් ලබා දෙන ලෙස සභාපතිවරයාගෙන් ඉල්ලා සිටින්නේ නම් ඒ සඳහා අතිරේක කාලයක් ලබා දිය හැකි අතර එය අතුරු ව්‍යවස්ථාව බලාත්මකවන දිනෙන් දින 180 ක කාලයක් නොඉක්මවන කාලයක් විය යුතුය.

14. සභාපතිවරයා විසින් මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ කර ඇති දැන්වීමකට අනුකූලවීමට බලපත්‍රලාභියා අපොහොසත් වන විට දී හා තව දුරටත් අතුරු ව්‍යවස්ථාවේ යම් වගන්තියක් උල්ලංඝනය වෙමින් කටයුතු සිදු වනවිටදී සභාපතිවරයා ඊට අදළ බලපත්‍රය අවලංගු කිරීම නිත්‍යානුකූල වන්නේය.

15. මෙම අතුරු ව්‍යවස්ථාවේ කවර හෝ වගන්තියක් උල්ලංඝනය කිරීම වරදක්වන අතර එම වරද සම්බන්ධයෙන් බලය ඇති අධිකරණයක් විසින් වරදකරු කිරීමෙන් පසු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(2) වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් වන්නේය.

16. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයකට යටත් පරිශ්‍රයක සිට බල ප්‍රදේශය තුළ හෝ ඉන් පිටත කවර හෝ පරිශ්‍රයක් සඳහා ඌරන් ප්‍රවාහනය කරනු ලබන විටක දී එසේ ප්‍රවාහනය කරනු ලබන සෑම තැනැත්තෙක්ම ප.ව. 6.00 සිට පෙ.ව. 6.00 දක්වා කාලය තුළ පමණක් ප්‍රවාහනය කිරීමට කටයුතු කළ යුතුය.

17. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවොත් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ :

''සභාපති'' යන්නෙන් බිංගිරිය ප්‍රාදේශීය සභාවේ සභාපති ද,

''සභාව'' යන්නෙන් බිංගිරිය ප්‍රාදේශීය සභාව ද,

''බලයලත් නිලධාරියා'' යන්නෙන් සභාපතිවරයා විසින් නිශ්චිතව ඒ සඳහා බලය දෙනු ලබන නිලධාරියෙක් ද,

''තැනැත්තා යන්නෙන්'' යම් පුද්ගලයකු හෝ සංස්ථාගත කරන ලද හෝ නොකරන ලද පුද්ගලයෙක් හෝ පුද්ගල මණ්ඩලයක් ද,

''ගෘහස්ථ ගොවිපලක්'' යන්නෙන් බලපත්‍රය සඳහා ඉල්ලුම් කරන අවස්ථාවේ දී ගොවිපලේ සිටින ඌරන් සංඛ්‍යාව 1-4 අතර ගොවිපලක් ද,

''සුළු පරිමාණ ගොවිපලක් යන්නෙන්'' බලපත්‍රය සඳහා ඉල්ලුම් කරන අවස්ථාවේ දී ගොවිපලේ සිටින ඌරන් සංඛ්‍යාව 5-24 අතර ගොවිපලක් ද,

''මධ්‍ය පරිමාණ ගොවිපලක්'' යන්නෙන් බලපත්‍රය සඳහා ඉල්ලුම් කරන අවස්ථාවේ දී ගොවිපලේ සිටින ඌරන් සංඛ්‍යාව 25-49 අතර ගොවිපලක් ද,

''මහා පරිමාණ ගොවිපලක්'' යන්නෙන් බලපත්‍රය සඳහා ඉල්ලුම් කරන අවස්ථාවේ දී ගොවිපලේ සිටින ඌරන් ගණන 50 ට වැඩි වන ගොවිපලක් ද,

''අදාල ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්වරයාගේ නියෝජිතයෙකු'' යන්නෙන් කර්මාන්තයට අදාළ බල ප්‍රදේශයට අයත් වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්වරයාගේ බලයලත් නියෝජිතයෙකු අදහස් වේ.

''පොදු ස්ථානයක්'' යන්නෙන් කිසියම් මාර්ගයක්, මං මාවතක්, වීථියක්, පටුමගක්, දෙවැටක්, පදික වේදිකාවක්, පොදු ඉඩමක්, කිසියම් රක්ෂිතයක්, ක්‍රීඩාපිට්ටනියක්, පොදු ගොඩනැගිල්ලක්, පොදු සුසාන භූමියක්, බස් නැවතුම්පළක්, දුම්රිය ස්ථානයක්, ගංගාවක්, ඇළක්, දොළක්, වැවක්, පොකුණක්, කලපුවක්, දිය කඩිත්තක්, දිය පහරක්, වැසි ජල කාණුවක්, මුහුදු වෙරළක්, සභාව සතු යම් ඉඩමක්, මහජනයාගේ පරිහරණය සඳහා වෙන්කර ඇති රජය සතු ඉඩමක් හෝ මහජනයාගේ පොදු පරිහරණයට ලක් වන වෙනත් ඕනෑම ස්ථානයක් අදාළ වේ.

18. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුත්තේ ය.

**උපලේඛන අංක 1**

**බිංගිරිය ප්‍රාදේශීය සභාව**

ඌරු කර්මාන්තය හේතුවෙන් සිදුවන මහජන පීඩා මැඩපැවැත්වීම හා මහජන සෞඛ්‍ය ආරක්ෂා කිරීම පිළිබඳව වූ අතුරු ව්‍යවස්ථාව යටතේ වූ බලපත්‍රය

බලපත්‍ර අංකය :..................................................

01. බලපත්‍රලාභියාගේ නම :..................................................

02. ලිපිනය :..................................................

03. ව්‍යාපාරය පිහිටි ස්ථානයේ ලිපිනය :..................................................

04. හැඳුනුම්පත් අංකය :..................................................

05. ඉල්ලුම්පත්‍ර අංකය :..................................................

06. නිකුත් කළ දිනය :..................................................

07. වලංගු කාලය :..................................................

................................................................,
සභාපති
ප්‍රාදේශීය සභාව,
බිංගිරිය.

දිනය :..............................

## උපලේඛන අංක II

### *බිංගිරිය ප්‍රාදේශීය සභාව*

ඌරු කර්මාන්තය හේතුවෙන් සිදුවන මහජන පීඩා මැඩපැවැත්වීම හා මහජන සෞඛ්‍ය ආරක්ෂා කිරීම පිළිබඳ වූ අතුරු ව්‍යවස්ථාව යටතේ වූ ව්‍යාපාරයක් පවත්වාගෙන යාමේ බලපත්‍රයක් සඳහා වන ඉල්ලුම්පත්‍රය

1. ව්‍යාපාරය :...........................................................................................................................................

2. ව්‍යාපාරය පිහිටි ස්ථානයේ ලිපිනය :...........................................................................................................

3. ඉල්ලුම් කරනු ලබන්නාගේ නම :..................................................................................................................

4. ලිපිනය :..................................................................................................................................................

5. ග්‍රාම නිලධාරී වසම :.................................................................................................................................

6. දුරකථන අංකය :.......................................................................................................................................

7. ඉල්ලුම්කරු පරිශ්‍රයේ/ඉඩමේ අයිතිකරු නොවන අවස්ථාවක දී,

   අයිතිකරුගේ නම :..........................................................................................
   ලිපිනය :......................................................................................................
   දුරකථන අංකය :............................................................................................

8. ව්‍යාපාරයේ ඇති කරනු ලබන සතුන් සංඛ්‍යාව :...............................................................................................

9. එම ස්ථානය සතුන් මස් සඳහා/සතුන් බෝ කිරීම සඳහා/සත්ත්ව කෑම සැකසීම සඳහා ද යන බව :...........................................

10. පරිශ්‍රය තුළ සිටිය හැකි උපරිම සතුන් සංඛ්‍යාව :...........................................................................................

11. පරිශ්‍රයට අදාල සම්පූර්ණ භූමි ප්‍රමාණය, (සනාථ කිරීම සඳහා වන මිනින්දෝරු සැලැස්මේ පිටපතක්), ඉදිකිරීමට අදාල අනුමත සැලැස්මේ පිටපතක්, පෙර වර්ෂයේ බලපත්‍රයේ පිටපතක් (අදාල වන විට දී), බදු ඔප්පුවක් හෝ පිළිගත හැකි සහතික පත්‍රයක් ඇමිණිය යුතුය.

12. පරිශ්‍රයට පැමිණෙන දළ මාර්ගය :.................................................................................................................
   .....................................................................................................................................................
   .....................................................................................................................................................
   .....................................................................................................................................................

මා විසින් සපයා ඇති ඉහත සඳහන් විස්තර සත්‍ය ඒවා බවත්, මාගේ ව්‍යාපාර සඳහා ගාස්තු අයකර බලපත්‍රයක් ලබා දෙන ලෙසත්, ප්‍රාදේශීය සභාව විසින් පනවා ඇති සියලු කොන්දේසි හා නියෝගවලට මා යටත් වන බවත්, මෙයින් අත්සන් කර පොරොන්දු වෙමි.

.......................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :.........................................

**කමිටු නිර්දේශය**

ගරු සභාපතිතුමා,
බිංගිරිය ප්‍රාදේශීය සභාව.

පහත කොන්දේසිවලට යටත්ව නිර්දේශ කරමි./නොකරමි.

කොන්දේසි/නිර්දේශ නොකිරීමට හේතු,

........................................................................................................................................................................................................
........................................................................................................................................................................................................
........................................................................................................................................................................................................
........................................................................................................................................................................................................

කමිටු සභාපති ..............................................
කමිටු සාමාජිකයින් ..............................................
..............................................
..............................................

ඉහත දක්වා ඇති තොරතුරු අනුව එම ස්ථානයේ .......................................................... ව්‍යාපාරයක් පවතින බවත්, ............................. වර්ෂයට අදාලව මෙම අතුරු ව්‍යවස්ථාවට අනුකූල බලපත්‍රයක් යටතේ ව්‍යාපාරයක් එහි පවත්නා බවත්, ඒ සඳහා වන බලපත්‍ර ගාස්තුව රුපියල් ................................... බවත් සහතික කරමි.

දිනය :.................................. ..............................................................
ආදායම් පරීක්ෂක/ ආදායම් පරිපාලක.

---

ගරු සභාපතිතුමා,
බිංගිරිය ප්‍රාදේශීය සභාව.

නිර්දේශ කර අනුමැතියට ඉදිරිපත් කරමි.

දිනය :.................................. ..............................................................
ලේකම්.

---

ලේකම්තුමා,
බිංගිරිය ප්‍රාදේශීය සභාව.

අනුමත කරමි/නොකරමි.

දිනය :.................................. ..............................................................
සභාපති.

10-393

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## දැන්වීමයි

**මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තනතුරු සඳහා බඳවා ගැනීම - 2019**

අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය සංශෝධනය කිරීම

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ කෘෂිකර්ම උපදේශක III ශ්‍රේණිය, සත්ත්ව සංවර්ධන උපදේශක III ශ්‍රේණිය, ජනපද නිලධාරි III ශ්‍රේණිය බඳවා ගැනීමේ තරග විභාගය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2,142 හා 2019.09.20 දිනැති *ගැසට් පත්‍රයේ* පළාත් සභා කොටසේ පළ කරන ලද දැන්වීමක් මගින් අයදුම්පත් කැඳවීමට කටයුතු කර ඇත. එහි සඳහන් අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය වන 2019.10.04 දිනය 2019.10.31 දින ලෙස සංශෝධනය කරනු ලැබේ.

මේ අනුව උක්ත *ගැසට්* නිවේදනයේ ''2019.10.04'' වශයෙන් සඳහන් වන සෑම ස්ථානයක්ම ''2019.10.31'' දින ලෙස සංශෝධනය විය යුතු බවත්, අනෙකුත් කරුණු වෙනස් නොවන බවත්, කාරුණිකව දැනුම් දෙමි.

මෙම බඳවා ගැනීම සම්බන්ධ වැඩිදුර විස්තර මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.psc.cp.gov.lk හි පළකර ඇති බව ද කාරුණිකව දන්වමි.

එම්. ජී. ඒ. තිලකරත්න,
ලේකම්,
මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා
කොමිෂන් සභාව.

2019 ඔක්තෝබර් මස 01 වැනි දින,
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
අංක 244, කටුගස්තොට පාර,
මහනුවර.

10-574

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | | | රු. ශ. |
|---|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව | ... | ... | 137 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට | ... | ... | 137 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට | ... | ... | 1,300 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට | ... | ... | 2,600 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මඟීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල | තැපැල් ගාස්තුව |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මඟින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සැහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සලකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2019** වර්ෂය | | | |
| **ඔක්තෝබර්** | 2019.10.04 | සිකුරාදා | 2019.09.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.10.11 | සිකුරාදා | 2019.09.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.10.18 | සිකුරාදා | 2019.10.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.10.25 | සිකුරාදා | 2019.10.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| **නොවැම්බර්** | 2019.11.01 | සිකුරාදා | 2019.10.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.11.08 | සිකුරාදා | 2019.10.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.11.15 | සිකුරාදා | 2019.11.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.11.22 | සිකුරාදා | 2019.11.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.11.29 | සිකුරාදා | 2019.11.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| **දෙසැම්බර්** | 2019.12.06 | සිකුරාදා | 2019.11.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.12.13 | සිකුරාදා | 2019.11.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.12.20 | සිකුරාදා | 2019.12.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.12.27 | සිකුරාදා | 2019.12.13 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.